# වර්ණ සන්නිවේදනය හා සංඥාර්ථ

## (ශ්‍රී ලාංකේය සංස්කෘතික වර්ණ සන්නිවේදනයේ පරිණාමය පිළිබඳ අධ්‍යයනයක්)


නම : ඩබ්ලිව්. ආර්. ධර්මතිලක

ශිෂ්‍ය අංකය :FGS/03/01/06/2011/02



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1224 |
| වර්ග අංකය: | |


කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ ජන සන්නිවේදනය පිළිබඳ දර්ශන විශාරද පශ්චාත් උපාධිය සඳහා ඉදිරිපත් කරන ලද පර්යේෂණ නිබන්ධයකි.

2015 අගෝස්තු

# සාරසංග්‍රහය

දෘශ්‍ය සන්නිවේදන ක්ෂේත්‍රයේ ප්‍රධාන මූලධර්මයක් ලෙස වර්ණය හැඳින් වේ. වර්ණය සන්නිවේදනයේ ප්‍රබල පෙලඹුම් කාරකයකි. එය අතිශය පෞද්ගලික සන්නිවේදන අවශ්‍යතා සහ පොදු සන්නිවේදන අවශ්‍යතා සපුරාලයි. වර්ණය ලෝකයේ විවිධ සංස්කෘතීන් සකස් කරන අතර, සංස්කෘතික පරිණාමයත් සමඟ එහි පරිණාමය ද සිදු වේ. වර්ණය විවිධ විෂය පරාසයන් ඔස්සේ ව්‍යාප්ත ව පවතින අතර, සංස්කෘතිය ඉන් එක් පැතිකඩකි. සංස්කෘතිය සැමවිට ම භෞතිකත්වයෙන් හා ආධ්‍යාත්මික සංකල්ප වලින් පෝෂණය ලබයි.

වර්ණ පිළිබඳ නිර්වචන සහිත ව විෂය හැඳින්වීම, අරමුණු, ගැටලුව සහ උපකල්පනය, සාහිත්‍ය අධ්‍යයනය, අධ්‍යයනයේ ක්‍රමවේදය, විෂය පථය සහ සීමා, අධ්‍යයනයෙහි වැදගත්කම සහ අධ්‍යයනයෙහි ප්‍රතිඵල විෂය ප්‍රවේශය ඇතුළත් පළමු පරිච්ඡේදයෙන් විස්තර කර ඇත. වර්ණයෙහි ප්‍රභවය හා විකාශය විවිධ විෂය පරාසයන් ඔස්සේ ව්‍යාප්තව පවතී. සංස්කෘතික ඉතිහාසයේ වර්ණය බටහිර හා පෙරදිග වශයෙන් කලාව, පූජාකර්ම, ආගමික පූජෝත්සව, සිරිත් විරිත්, පොදු උත්සව, ගොඩනැඟිලි හා පාරිභාරික ද්‍රව්‍ය ඔස්සේ ව්‍යාප්ත ව පවතී. මෙසේ ලෝක ඉතිහාසයේ වර්ණ භාවිතය හා ව්‍යාප්තිය පිළිබඳ ව දෙවන පරිච්ඡේදයෙන් සාකච්ඡා කර ඇත. වර්ණ සංජානනයේ දී පුද්ගල ක්‍රියාකාරිත්වය ඒ හා සම්බන්ධවන ඉන්ද්‍රිය, මනස හා ආකල්ප පිළිබඳ අවබෝධය වැදගත් වේ. මෙසේ වර්ණ සන්නිවේදනය හා සංජානනය පිළිබඳ ව තෙවන පරිච්ඡේදයෙන් විස්තර කර ඇත. සංස්කෘතික ගතිකත්වය තුළ ලෝකයේ සෑම දෙයක් ම පරිණාමය වීම සිදු වේ. ඒ හා සමගාමී ව වර්ණය ද පරිණාමය වේ. යුග වශයෙන්, සම්ප්‍රදායන් වශයෙන් පරිණාමය සිදු වූ අතර, තාක්ෂණය හා විද්‍යාත්මක දැනුම වර්ණයේ පරිණාමයට බලපෑ ප්‍රබල සාධකයන් විය. සංස්කෘතික වර්ණ පරිණාමයේ දී භෞතික හා ආධ්‍යාත්මික වූ යම් යම් දේ ඉවත්ව යෑමත්, අළුත් වීමත්, සරළ වීමත් සිදු වේ. එය කාලීන අවශ්‍යතා මත පදනම් වේ. සිව්වන පරිච්ඡේදයෙන් භෞතික හා ආධ්‍යාත්මික සංකල්ප තුළින් ගොඩනැඟුණු ශ්‍රී ලාංකේය සංස්කෘතික වර්ණ සන්නිවේදනයේ පරිණාමය පිළිබඳ සාකච්ඡා කර ඇත. වර්ණයෙහි හැඩරුව පිළිබඳ අවබෝධය, වර්ණයෙහි ආකාරය හා ස්වභාවය හඳුනා ගැනීම, වර්ණ තුළින් ගෙන එන භෞතික මෙන් ම ආධ්‍යාත්මික සංකේතාර්ථ අවබෝධය සහ වර්ණ සන්නිවේදනයේ හැඩරුව හඳුන්වා දී ම පස්වන පරිච්ඡේදයෙන් සිදු කර ඇත. වර්ණ විකාශනය තුළ භෞතික හා ආධ්‍යාත්මික වශයෙන් සමාජ සංස්කෘතික කාර්යයෙහි ලා වර්ණ භාවිතයේ දී හඳුනාගත් නිගමනයන් සහ භෞතික පරිභෝජනයේ දී ආධ්‍යාත්මික දෘෂ්ටියෙහි වැදගත්කම යෝජනා මඟින් පෙන්වා දී ම හයවන පරිච්ඡේදයෙන් සිදු කර ඇත.

ප්‍රමුඛ පද : වර්ණ, භෞතික හා ආධ්‍යාත්මික, සංජානනය, පරිණාමය, සංඥාර්ථ

# Abstract

Colour is known as one of the main principles in the field of Visual Communication. Colour is a powerful stimulant in communication. It fulfills extremely private as well as public communication requirements. Colour helps shaping of various cultures of the world and it evolves concurrently with the cultural evolution itself. Colour is distributed across many facets of subject areas where culture is one of those facets. Culture is always enriched with physical and spiritual ideologies.

The first chapter of this thesis introduces the subject of colour with its definitions, the objectives, the problem, assumptions followed by a summary of the literature survey and methodology adopted in this study. Further, it also discusses about the scope of the subject, the approach, the importance and provides with a summary of the results obtained in the thesis. The source and distribution of colour transcends through various subjects and fields. In cultural history, colour has played an important role in areas such as art, rituals, religious festivals, traditions, public events, buildings and even consumer products. The second chapter discusses about the usage and the distribution of colour in the world history. In colour perception, personal activities and the knowledge pertaining to that of the organs involved, the mind and the attitudes are also important. The third chapter describes various aspects on colour communication and perception. Human evolution in the world takes place in the context of cultural dynamics. In parallel to this takes place the evolution of the colour through different era and traditions. One of the powerful factors that affected the evolution of the colour is the developments in the technology and the scientific knowledge. In the cultural evolution of colour, based on the timely/current requirements, some of the physical and spiritual aspects may disappear; some maybe renewed and perhaps be simplified. The fourth chapter discusses the cultural evolution of Sri Lankan colour communication that has been built upon the physical and spiritual ideologies. The fifth chapter gives an introduction to the understanding of different shapes of colour, recognition of the methods and the nature of the colour, that of the various physical as well as spiritual semiotics communicated by colour. The sixth chapter presents the conclusions of the present study pertaining to sociocultural aspects in the physical and spiritual context of the evolution of the colour. Further, it has also been proposed the importance of the spiritual insight in the physical usage of colour.

**Keywords: Colours, Physical and Spiritual, Perception, Evolution, semiotics**